# ආණ්ඩුවේ අපේක්ෂකයා වෙනුවෙන් ඇමැතිවරු මහජන දේපළ වනසති

## පැෆරල් කියයි

■ සාලිය කුමාර ගුණසේකර

මධ්‍යම ආණ්ඩුවේ ඇමතිවරුන් බොහෝ දෙනෙකු ආණ්ඩුවේ අපේක්ෂකයා ප්‍රවර්ධනය කිරීම සඳහා මහජන දේපළ සහ මහජන මුදල් භාවිතා කරන බවට නිරීක්ෂණය වී ඇතැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි සඳහන් කරයි.

පැෆරල් සංවිධානයට ලැබී තිබෙන පැමිණිලි එකසිය තිස් පහෙන් (135) හැට පහක්ම (65) එනම් සියයට හතලිස් අටක්ම (48%) අයුතු ලෙස මහජන දේපොළ සහ දේශපාලන බලය පක්ෂ හෝ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වන පැමිණිලි බව ද ඔහු කීවේය.

අසමමිතික ඡන්ද ව්‍යාපාරයක් රාජ්‍යයේ පොදු ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිකවරණයට බාධා පමුණුවන අතර මහජන දේපළ භාවිතා කිරීම මෙම තත්ත්වය තවත් බැරෑරුම් බවට පත් කරන බවද ඔහු පැවසීය.